# අනුර ශ්‍රීනාත් "සිත්තරු" සමගින්

***ප්‍රවීණ චිත්‍ර කතා ශිල්පීන් දෙදෙනෙකු වන අනුර ශ්‍රීනාත් සහ ජූඩ් ශ්‍රීමාල්ගේ සම සංස්කාරකත්වයෙන් "සිත්තරු" නමින් සතිපතා පලවන නව චිත්‍රකතා පත්‍රයක් අගෝස්තු මස 03 වන දින උපාලි ප්‍රකාශනයක් ලෙස වෙළඳ පොළට නිකුත් කෙරේ. එය නිමිති කර ගෙන අනුර ශ්‍රීනාත් සමඟ කළ කෙටි කතා බහකි මේ.***

**ඇයි මේ විදිහට චිත්‍රකතා පත්‍රයක් කරන්න අදහස් කළේ?**
චිත්‍ර කතා පත්තර කියන්නේ පුවත්පත් කලාවේ බොහොම සුන්දර ප්‍රකාශනයක්. විනෝදාශ්වාදය වෙනුවෙන් කාලයක් තිස්සේ පාඨකයන් අතරට ගිය රසවිතක්. දැනට දශක දෙක තුනකට කලින් චිත්‍ර කතා නොකියපු කෙනෙක් නෑ. පසු කාලයේ යම් යම් හේතු උඩ මේක අභාවයට ගිහින් අද වෙනකොට ලංකාවේ එකම චිත්‍රකතා පත්තරයක්වත් ප්‍රකාශයට පත්වෙන්නේ නෑ. අනෙක් පැත්තෙන් දැන් ජනතාවට විනෝදාශ්වාදය ගෙන එන දේවල් බොහොම වියදම් අධික දේවල්. චිත්‍රපටියක්, නාට්‍යයක් බලන්න වුණත් ලොකු මුදලක් වියදම් කරන්න වෙනවා. දැනට ඉන්න චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ රසවිඳින්න ජනතාවට ඉඩක් නෑ. ඒ අයගෙන් පස්සේ රටට චිත්‍ර ශිල්පීන් නැතිවෙනවා. ඒ නිසා නවකයන්ට චිත්‍ර හුරුකළ යුතුයි. ඒ වගේ කරුණු ගණනාවක් සලකලයි අපි අලුත් චිත්‍රකතා පත්තරයක් කරන්න අදහස් කළේ.

**දශක කීපයකට පෙර චිත්‍ර කතා පත්තර කියන කලාව සමාජය ආක්‍රමණය කරලා තිබුණා. ඒවට සැලකිය යුතු වටිනාකමක් තිබුණා. අද එහෙම නෑ. ඒ තත්ත්වය වෙනස් වුණේ කොහොමද?**
ඒකට ගොඩක් හේතු බලපෑවා. බොහෝ අය චිත්‍රකතා කියන කලාව බොහොම බොළඳ පැත්තට අරගෙන ගියා. තව පිරිසක් කාමුක පැත්තට අරගෙන ගියා. ඒ වගේ උත්සාහයන් නිසා චිත්‍ර කතා පත්තර ගෙවල් ඇතුළට නොගන්න තත්ත්වයක් පසුව ඇති වුණා. ඉස්සර දෙමව්පියෝ තමයි චිත්‍ර කතා පත්තර ගෙවල්වලට අරන් ගියේ. මොකද ළමයින්ට කියවීමේ රුචිකත්වය ඇතිකරන්න. ඒක අධ්‍යාපනයටත් අවශ්‍යයයි. නමුත් අර වගේ වුණාට පස්සේ චිත්‍ර කතා පත්තර ප්‍රතික්ශේප වුණා. කාලයක් තිස්සේ මේ විදිහට වෙනකොට චිත්‍ර කතා පත්තර වෙළඳපොළ කඩා වැටුණා. ඒ අතරේ රූපවාහිනියත් ආවා. එහි තිබුණු සුවිශේෂ ලක්ෂණාත් චිත්‍ර කතා පත්තර, සමාජයෙන් බැහැර වෙන්න හේතු වුණා.

**රූපවාහිනිය අන්තර් ජාලය වැනි මාධ්‍ය අද ජනතාව අතරට පහසුවෙන් විනෝදාශ්වාදය ගෙන යනවා. ජනතාව මේවට ඇබ්බැහි වෙලා ඉන්නේ. ඒ වගේ පසුබිමක චිත්‍ර කතා පත්තරයකට පාඨකයන් රැස්කර ගැනීමට හැකිවේවිද?**
අන්තර් ජාලය තවමත් අපේ රටේ පුළුල්ව ව්‍යාප්ත වුණ දෙයක් නෙවෙයි. සීමිත පිරිසකටයි ඒ පහසුකම් තියෙන්නේ. රූපවාහිනිය නම් බලෙන්ම ගේ ඇතුළට ඇවිල්ලා තියනවා. නමුත් ඒකෙ රසය සම්පූර්ණයෙන්ම ගිලිහිලා. ඒක මම නොකීවට රූපවාහිනිය බලන අය දන්නවා. දැන් ටෙලි නාට්‍ය කියන එක බොහොම බොළඳ, ඉතා පහත් මට්ටමේ බෝරිං කලාංගයක් බවට පත්වෙලා තියනවා. කලාතුරකින් තමයි හොඳ එකක් දකින්න ලැබෙන්නේ. අනෙක් අතට චිත්‍රකතා පත්තරයකට සුවිශේෂ අනන්‍යතා ලක්ෂණාත් තියනවා. තමන්ට කැමති වෙලාවක කැමති තැනකට වෙලා රස විඳින්න පුළුවන්. අනික නොදියුණු අපේ රටේ චිත්‍රකතා අයින් වුණාට අදටත් දියුණුම රටවල පවා චිත්‍රකතා කියන එක ප්‍රභල විදිහට තියනවා. ඒ නිසා අපි හිතනවා හොඳ මට්ටමේ චිත්‍ර කතා පත්තරයකට පාඨක පිරිසක් රැස්කර ගන්න අමාරුවෙන එකක් නෑ කියලා.




**පසුගිය කාලයේ ඔබ චිත්‍රකතා පත්තරයක් කළා. නමුත් එය අඛණ්ඩව පවත්වාගෙන යන්නට හැකියාවක් ලැබුණේ නෑ. ඒ අත්දැකීමත් එකක බලනකොට මෙය අභියෝගයක් කියලා හිතෙන්නේ නැත්ද?**
මට චිත්‍ර කතා ගැන ලොකු උණක් තියනවා. දැනටත් මම ජාතික පුවත්පත්වලට චිත්‍රකතා අඳිනවා. ඒ අතරේ පහුගිය කාලේ මම ටෝක්ස් ඇන්ඩ් ජෝක්ස් කියන චිත්‍ර කතා පත්තරය කළේ රටේ ඉන්න අනෙකුත් දක්ෂ චිත්‍ර කතා ශිල්පීන්ගේ නිර්මාණ පාඨකයන් අතරට ගෙනියන අරමුණෙන්. අනික චිත්‍රවලට ආශාවක් තියන තරුණ අයට චිත්‍ර කතා පෙන්නන්න ඕනේ කියන අරමුණෙන් තමයි මම සල්ලිකාරයෙක් නොවුණත් බොහොම සකසුරුවම් විදිහට ටෝක්ස් ඇන්ඩ් ජෝක්ස් කළේ. නමුත් බෙදාහැරීම් පැත්තේ අඩුපාඩු තිබුණා. එහෙම තියෙද්දිත් ජනතාව ඒක පිළිගත්තා. ඒක නැවතුණේ ආර්ථික ප්‍රශ්ණ නිසා. ඒ නිසා තමයි උපාලි පුවත්පත් ආයතනයත් එක්ක එක්වෙලා චිත්‍ර කතා පත්තරයක් කරන්න තීරණය කළේ.

**උපාලි පුවත්පත් ආයතනය ආරම්භ වෙන්නෙත් චිත්‍ර මිත්‍ර කියන චිත්‍ර කතා පත්තරෙන්. නමුත් පසු කාලීනව එම ආයතනය චිත්‍ර කතා පත්තර ප්‍රකාශයට පත් කිරීම නවතා දැමුවා.**
මම චිත්‍ර කතා මාධ්‍යයට හරියටම පිවිසුණෙත් චිත්‍රමිත්‍ර චිත්‍ර කතා පත්තරෙන්. ඊට කලින් නාඹර තරුණයෙක් කාලේ මාස කීපයක් සුහද කියන චිත්‍ර කතා පත්තරේට ඇන්දා. පස්සේ උපාලි විජේවර්ධන මහත්තයා පත්තර ප්‍රකාශනය අරඹන වෙලාවේ චිත්‍ර මිත්‍රට සම්බන්ධ වුණා. ඒ කාලේ රටේ චිත්‍ර කතා පත්තර ගොඩක් තිබුණා. නමුත් ඒවායේ අන්තර්ගතය බොහොම නරක පැත්තට යමින් තිබුණා. ඒ නිසා සමස්ථ චිත්‍ර කතා පත්තරවලට ආව සෝදාපාලුව චිත්‍ර මිත්‍ර පත්තරේටත් බලපෑවා. අනික ඒ වෙනකොට උපාලි ආයතය තවත් පත්තර කීපයක්ම ප්‍රකාශයට පත් කරනවා. චිත්‍රමිත්‍ර නැතිවුණා කියලා ඒ අයට ප්‍රශ්ණයක් වුණේ නෑ. නමුත් මෙවර අපි සාකච්ඡා කරන්න යනකොට ඒ තත්ත්වය වෙනස්. අපි පැහැදිලි කළා ඇයි අද දවසේ රටට චිත්‍ර කතා පත්තරයක් අවශ්‍ය කියලා. ඒ ගොල්ලත් සමීක්ෂණ කරලා බැලුවා ඒ ගැන. ඊට පස්සේ පිළිගත්තා අපි කියන දේ ඇත්ත කියලා.

සංවාද සටහන
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**



**මාධ්‍ය සමාජයේ විශාල ශ්‍රම සූරාකෑමක් සිදුවෙනවා. පත්තර ව්‍යාපාරයෙත් ඒ වගේම තමයි. චිත්‍ර කතා ශිල්පීන්ට සොච්චම් මුදලක් ගෙවලා ව්‍යාපාර හිමිකරුවන් විශාල වශයෙන් ලාභ උපයන ආකාරය අපි කාලෙකදි අත්දැකපු දෙයක්. මේ කාරණයේදී "සිත්තරු" කොහොම හැසිරෙයිද?**
ශ්‍රමයේ වටිනාකමට සරිලන ගෙවීමක් කොතනකවත් සිද්ධ වෙන්නේ නෑනේ. එහෙම ලැබෙනවා නම් ලෝකේ මේ වගේ පිරිහෙන්නෙත් නෑ. යුද්ධ ඇති වෙන්නෙත් නෑ. ඒක ලොකු කතන්දරයක්. ශ්‍රමයේ වටිනාකමට ගෙවීම් ලැබෙන්නේ සමාජවාදී ක්‍රමයක් යටතේ විතරයි. මෙතනදිත් ශිල්පීන්ට හරියන මුදල ලැබෙනවා කියලා මම කියන්නේ නෑ. නමුත් හොඳ ගෙවීමක් අපි කරනවා. ශිල්පීනුත් ඒක පිළි අරගෙන තියනවා. ඉදිරියේදී එය තවත් වර්ධනය කරගන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ඔබ සමඟ "සිත්තරු" ට එකතු වෙන අනෙකුත් ශිල්පීන් කවුරුන්ද?**
ජූඩ් ශ්‍රීමාල්, බන්ධුල හරිස්චන්ද්‍ර, ඇන්ටන් බී පෙරේරා, සුමතිපාල ජෝතිපාල සොහොයුරන්, දයා රාජපක්ෂ, දර්ශණ වනිගරත්න, අරවින්ද, ප්‍රගීත් අබේධීර, සරත් මහින්දසිරි, ෆීලික්ස් පෙරේරා, ආනන්ද දිසානායක, කුමාර, මේ වෙනකොට එකතුවෙලා ඉන්නවා.




**පස්වාන් දහස් ගානට බදු ගහන මහා රජාණෙනි, මේ වතාවෙත් මහා රාජවරණයට ඔබවහන්සෙම ඉදිරිපත් වෙනවැයි?**
මම නැතුව වෙන මොකා ඉදිරිපත් වෙන්නද පුරෝහිත?

**ඇයි පුත් කුමාරයා?**
නහී කාලෝ අයන්තේ. පුත් කුමරුන්ට රාජ්‍ය බාර දෙන්නට තව කල් තියනවා පුරෝහිත. එතකන් මමමයි කරනනේ.

**රට වැසියෝ කැමති වෙයිද මහා රජාණෙනි ඔය කෙරුවාවට?**
උන්ගෙ කැමැත්ත බම්බුවටද පුරෝහිත. උන්ගේ නියෝජිතයෝ තුනෙන් දෙකකටත් වඩා වැඩේට කැමැත්ත දුන්නනේ. 18 සංශෝධනය කරල. දෑත් ශක්තමත් කරලා.

**මහ සෙනෙවි මලයණ්ඩි කැමති වෙයිද?**
උෟට මම අගමැතිකම දෙනවා. රජකම නම් කොහොමවත් දෙන්න බෑ. උගේ නසරාණි වැඩ නිසා ජනතාවත් උෟට ඒතරම් කැමති නෑ.
රට වැසියෝ දන්නවානේ ඔබතුමා තමයි මලයණ්ඩිව ඒවට දාලා තියෙන්නේ කියලා.
කොහොමද පුරෝහිත එහෙම වෙන්නේ. උෟ කරන නසරාණි වැඩ ඔක්කොම කරන්නේ මම නැතිවෙලාවල් බලලානේ.

**එතකොට නඩේ අනෙක් සෙට් එක කරපු කියපු වැඩ?**
ඒවත් එහෙම තමයි පුරෝහිත. අපරාධ කාරයන් නිදහස් කරන්නෙත් මම රටේ නැති වෙලාවට. හාල් ඇටේ ඉදළා බදු වැඩි කන්නෙත් මම නැති වෙලාවට. මරක්කලයන්ව මස් කරන්නෙත් මම රටේ නැති වෙලාවට. දැන් ඔය මාව විදුලි පුටුවෙ ඉන්දන්න හදන වෙල්ලමුල්ලිවයික්කාල් වැඩ සිද්ධ වුණෙත් මම රටේ නැති වෙලාවක. මේ එකකටවත් මගේ කිසීම කිසි සම්බන්ධයක් නෑ පුරෝහිත.

**එතකොට අගවිනිසුරුවරිය ගෙදර යැව්වෙ?**
මමද යකෝ, පහරිලියෙන්නේ ඒක කළේ.

**එතකොට මාධ්‍ය කම්බස් කරලා ලසන්ත කොලුව මරණකොට?**
එතකෙට මම බුදුන් වැඳ වැඳ හිටියේ

**ඒ කියන්නේ ඔබතුමා මහාරාජ වුණාට මෙච්චර කාලයක් රට පාලනය කරලා තියෙන්නේ ඔබතුමා නෙවෙයිද? රට අරාජිකවද තිබිල තියෙන්නේ?**
ඇත්ත වශයෙන්ම ඔව්. අන්න ඒ තත්ත්වයෙන් රට මුදාගන්න තමයි පුරෝහිත මේ පාර මම මහාරාජවරණයට ඉදිරිපත් වෙන්නේ. හොං හොං හොං

**මරා සාද්**


## ජ්‍යොතිෂය / ASTROLOGY

භාව කේන්ද්‍රය අනුව පලාපල කථනය,
කේන්ද්‍ර සෑදීම, නැකැත් සෑදීම,
පොරොන්දම් බැලීම හා විවාහ දෝෂ පරීක්ෂා කිරීම
සියළුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න.

ජ්‍යොතිර්වේදී
**දේවසිරි විද්‍යාරත්න (M.A)**
90777523 - 0406 864 793